# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2086/41 - 2018 අගෝස්තු මස 31 වැනි සිකුරාදා - 2018.08.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

මගේ අංකය : IR/07/10/2012 නඩු අංකය : A 3590

**කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය**

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2015.03.23 දිනැති හා අංක 1907/13 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2015.03.12 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 03, ඇලෝයි මාවත, අංක 06හි පිහිටි ලංකා වතු සේවා සංගමය (අනුර වසන්ත ආදිහෙට්ටි මයා වෙනුවෙන්) හා අනෙක් පාර්ශ්වය වශයෙන් කහදූව, රැකඩහේන හි පිහිටි රැකඩහේන ප්ලාන්ටේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2018.07.19 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 අගෝස්තු මස 16 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය : IR/07/10/2012

කාර්මික අධිකරණයේ දී ය.

ලංකා වතු සේවා සංගමය,
06, ඇලෝයි මාවත,
කොළඹ 03.
(අනුර වසන්ත ආදිහෙට්ටි මහතා වෙනුවෙන්)

*ඉල්ලම්කරු*

සහ

රැකඩහේන ප්ලාන්ටේෂන් (ප්‍රයිවට්)
ලිමිටඩ්,
රැකඩහේන,
කහදූව.

*වගඋත්තරකරු*

යන දෙපාර්ශ්වය අතර ඇති කාර්මික ආරවුල සම්බන්ධව ප්‍රදානයයි.

අධිකරණ හා කම්කරු සබඳතා ගරු අමාත්‍ය විජයදාස රාජපක්ෂ මහතා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන්, තමා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා එක්කොට 2015.03.12 දින මා වෙත යොමු කොට ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පැවති කරුණ වනුයේ :

''රැකඩහේන ප්ලාන්ටේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් යටතේ දැනට මොටකන්ද වතුයායේ ක්ෂේත්‍ර නිලධාරියෙකු ලෙස සේවය කරන අනුර වසන්ත ආදිහෙට්ටි මහතා එම සමාගම යටතේ රැකඩහේන වත්තේ සේවය කරන අවධියේ ඔහු වෙත ලබා දුන් නිල නිවස කිසිදු විකල්ප දීමනාවක් නොගෙවා ආපසු ලබා ගැනීම යුක්ති සහගතද? යන්නත් එසේ නොවන්නේ නම් ඔහු වෙත ලබා දිය යුතු සහන කවරේද? යන්නත් පිළිබඳව වේ.''



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*විභාගයේදී දෙපාර්ශවයේ සහභාගීත්වය කෙබඳු වීද?*

I. ඉල්ලුම්කරු වෙනුවෙන් නියෝජිත ඩී. වීරසූරිය මහතා සහභාගී වීම.

II. වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් නීතීඥ තිළිණ පණ්ඩිතරත්න මහතා සහභාගී වීම.

III. ඉල්ලුම්කරු පමණක් සාක්ෂි සහ ලිඛිත දේශන ඉදිරිපත් කිරීම.

IV. සාක්ෂි, හරස් ප්‍රශ්න, නැවත ප්‍රශ්න සඳහා දෙපාර්ශවයම ප්‍රයෝජන ගැනීම.

V. ලිඛිත දේශන සඳහා ඉඩ ලබා දුන්නද වගඋත්තරකරු එයින් ප්‍රයෝජන ලබා නොගැනීම.
යනාදී ලෙසින් ප්‍රයෝජන ලබා ගන්නා ලදී.

VI. විභාගය ආරම්භයේදී ම වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් නීතීඥ මහතා මූලික විරෝධතා කීපයක් ඉදිරිපත් කරන ලදී. එනම් :-

(අ) ආරවුල සම්බන්ධව සඳහන් කරන විටදී ආරවුල කවදා පැවතියේද? නැතහොත් දැන් පවතීද යන වග සඳහන්ව නොතිබීම-

(ආ) යොමුවේ සඳහන් ''දැනට මොටකන්ද වතුයායේ ක්ෂේත්‍ර නිලධාරියෙකු වශයෙන් සේවය කරන අනුර වසන්ත ආදිහෙට්ටි මහතා'' යන්නෙන් සඳහන් කිරීමෙන් එය අද දිනද නැතහොත් යොමුවේ සඳහන් දිනය වූ 2014.12.19 දින සේවය කරන සේවකයෙක්ද යන වග අපැහැදිලි බව-

(ඇ) ඉල්ලුම්කරු හා වගඋත්තරකාර පාර්ශවය අතර කිසිදු කාර්මික ආරවුලක් නොමැති හෙයින් යොමු කිරීම දෝෂ සහිත බව,

(ඈ) ඉල්ලුම්කරු හා වගඋත්තරකරු අතර සේව්‍ය සේවක සම්බන්ධතාවක් නොපැවතී බව,

(ඉ) පදිංචි නිවසින් ඉවත් කිරීම සම්බන්ධව ගාල්ල කම්කරු විනිශ්චය සභාවේ විභාගයක් පවත්නා බව ආදියයි.

එකී සියලු විරෝධතා ප්‍රතික්ෂේප කරන බව ඉල්ලුම්කරුගේ නියෝජිත මහතා ප්‍රකාශ කළේය. තවද විරෝධතාවයන් පිළිබඳව පිළිතුරු සපයන ඉල්ලුම්කරුවන්ගේ නියෝජිත මහතා ඔහුගේ පිළිතුරු ප්‍රකාශයෙන් ආරවුලට හේතු වූ දින වකවානු ස්ථානය පිළිබඳව කරුණු ඉදිරිපත් කොට ඇත. යොමුවෙහි ඉල්ලුම්කරු ''වගඋත්තරකාර සමාගම යටතේ රැකඩහේන වත්තේ සේවය කරන අවධියේ'' යනුවෙන් සඳහන් වීම තුළ ආරවුලට හේතු වූ කරුණු සම්බන්ධව කාල වකවානු පැහැදිලි වේ. ඒ අනුව 2015.11.05 දින ඉල්ලුම්කරුට සිය නඩුව ආරම්භ කිරීමට නියෝග දී ඇත.

වගඋත්තරකාර ආයතනයේ විරෝධතාවයන් අතර කවදා පැවති ආරවුලක්ද හෝ ආරවුල සම්බන්ධ කරුණු උපචය වූ දින වකවානුවක් ප්‍රකාශිතවම සඳහන් නොවීම, මෙම ආරවුල විභාග කළ නොහැකි කරුණක්ය යන්නට පිළිතුරු 1993.02.23 දිනැති රැකඩහේන වතුයායෙහි වතු අධිකාරී ඩී. එස්. පී. රංජන් මහතාගේ ලිපියෙන් ඉල්ලුම්කරු වෙත වෙන් කරන ලද ක්ෂේත්‍ර නිලනිවාසය පිළිබඳ ''A1''වශයෙන් සලකුණු කර ඇති ලේඛනයෙහි වගඋත්තරකරු යටතේ සේවය කළ බව එනයින්ම පැහැදිලි වේ.

යොමුවෙහි මෙම ඉල්ලුම්කරු වගඋත්තරකාර සමාගම යටතේ සේවකයෙක්ව සිටි අවධියේ මෙම ආරවුල කම්කරු කොමසාරිස් තුමා වෙත යොමු කිරීම සිදුවීම හා ''වගඋත්තරකාර සමාගම යටතේ රැකඩහේන වත්තේ සේවය කරන අවධියේ'' යනුවෙන් සඳහන් වීම තුළ ආරවුලට හේතු වූ කරුණු මත ආරවුලට සම්බන්ධ කාල වකවානුව පැහැදිලි වන බවද මූලික විරෝධතාවය බිඳ හෙළන බව පිළිගනිමි.

*ඉල්ලුම්කරුගේ සාක්ෂියෙන් හෙළිවන කරුණු*

I. 1988.10.01 දින වගඋත්තරකාර ආයතනයේ සේවයට බැඳුණු බව (කාර්යය සටහන් පිටුව 35)

II. ''ඉ1'' ලෙසින් සලකුණු කරන ලද පත්වීම් ලිපිය මගින් ක්ෂේත්‍ර නිලධාරියෙක්ව බැඳීම ඔප්පු කර සිටීම.

III. තමාගේ පදිංචියට වතුයායේ නිල නිවසක් ලබා දුන් බව.

IV. 1993.03.01 සිට නිල නිවසේ පදිංචි වූ බව.

V. 2011.02.04 දින තෙක් එහි පදිංචිව සිටි බව එදින තමා ගෙයි නැති අවස්ථාවක වෙනත් ඉබි යතුරු දමා වගඋත්තරකරුගේ නිලධාරීන් තමා බලෙන් නිවසින් නෙරපා හැරි බවත්,

VI. ඒ සම්බනධව තමා නාගොඩ පොලිස් ස්ථානයට පැමිණිලි කළ බවත් එය ''ඉ5'' ලෙස සලකුණු කළ බවත්, පැමිණිල්ලේ සහතික පිටපතක් ඉ6 ලෙස සලකුණු කරන බවත්,

VII. 2012.05.31 දින අනුමිත ලෙස සේවයෙන් පහ කළ බවත්,

VIII. රැකඩහේන වතුයායේ සිට මොටකන්ද වතුයාය වෙත කි.මී. 53 දුර ස්ථාන මාරු කළ බවත්, (2011.12.01 වන දින) ඒ මත දෛනිකව රු.352 හෝ 375ක ගමන් ගාස්තුවක් දැරීමට සිදු වූ බවත්,

IX. එසේ සම්පූර්ණ දින 925ක් සේවයට පැමිණි බවත්, ඒ කාලයට අදාලව නිවාස කුලී රු. ලක්ෂ දෙකහමාරක්ද, ගමන් වියදම් සඳහා ලක්ෂ හතරක මුදලක්ද අයැද සිටින බවත් ඉල්ලා සිටියේය.

වගඋත්තරකාර පාර්ශවයේ උගත් නීතීඥ මහතාගේ මූලික විරෝධතාවයට පිළිතුරු පහත සඳහන් කරමි.

(අ) කම්කරු කොමසාරිස්තුමාගේ යොමුවේ සඳහන් ''දැනට මොටකන්ද වතුයායේ ක්ෂේත්‍ර නිලධාරියෙකු ලෙස සේවය කරන'' යන වාක්‍යාංශයෙන් යොමුව සඳහා අත්සන් කොට ඇති 2014.12.19 යන දිනයේදීම නොව ආදිහෙට්ටි මහතා එනම් මෙම බේරුම්කරණ

නඩුවේ ඉල්ලුම්කරු සේවය භාරගත් 1988.10.01 දින සහ හෙතෙම නිල නිවාසයෙන් නෙරපා හරින ලද 2011.02.04 යන දිනත් අතර සේවය කළ කාල පරාසය තුළ බව පිළිගත යුතුව ඇත. ඒ අනුව ''දැනට'' යන්නෙන් කම්කරු කොමසාරිස්තුමා යොමුව සඳහා සිය අත්සන යෙදූ 2014.12.19 දිනය නොව ඉල්ලුම්කරු සහ වගඋත්තරකාර යන දෙපාර්ශවය අතර කම්කරු ආරවුල ඇති වූ සමය යන්නෙන් ගණන් ගෙන මෙම ආරවුල විසඳීමට සාක්ෂි හා කරුණු පරීක්ෂා කළ බව සඳහන් කරමි.

වගඋත්තරකරු වෙනුවෙන් ඉදිරිපත් කොට ඇති නීතීඥ තිළිණ පණ්ඩිතරත්න මහතාගේ දින රහිතව විස්තර ප්‍රකාශයෙහි අදාළ ආරවුල,

I. සුළු ආරවුලක් බව,

II. යොමුවේ ආරවුලට හේතු වී ඇතැයි සඳහන් කරුණ උපවය වූ දිනක්, වකවානුවක් එම ඡේදයේ සඳහන් නොකිරීම බලවත් නීතිමය දෝෂයක් බව,

III. මෙම ආරවුල විභාග කළ නොහැකි ආරවුලක් බව,

IV. ''දැනට මොටකන්ද වතුයායේ ක්ෂේත්‍ර නිලධාරියෙක් වශයෙන් සේවය කරන අනුර වසන්ත ආදිහෙට්ටි මහතා'' යනුවෙන් යොමුවේ සඳහන් කර තිබීම, අසත්‍ය සාවද්‍ය කරුණක් බව,

V. ඔහු අද දින සේවායෝජක සමාගමේ සේවකයෙක් නොවන බව,

VI. ''අද දින ඔහු හා සේවායෝජක අතර නිවසක් පිළිබඳ ආරවුලක් නොපවතින බව,

VII. ''ඔහු අද දින සේවකයෙක් නොවන හෙයින් ආරවුලක් තම සේවා යෝජක සමඟ ඇතිනම් එය හුදෙක් රැකියාව කෙලවර වීම/ අවසන් වීමක් පිළිබඳ එකක් පමණක් වන බවත් එවැන්නක් මෙම කාර්මික ආරවුල් පනත යටතේ ''31බී'' වගන්තිය යටතේ කම්කරු විනිශ්චය සභාවක් මඟින් විසඳිය යුතු ආරවුලක් බව''

VIII. යොමු කරන ලද ආරවුල ලංකා වතු සේවා සංගමය මඟින් කළද, අද දින එම වෘත්තීය සමිතියේ සාමාජිකයෙක් නොවන හෙයින් පැමිණිල්ල පවත්වාගෙන යා නොහැකි බව,

IX. වගඋත්තරකාර සමාගම යටතේ ලංකා වතු සේවා සංගමයක් හෝ ශාඛාවක් නොමැති බව,

X. ඉල්ලුම්කරු වෙත කිසිදු අවස්ථාවක නිල නිවාසයක් ලබා නොදුන් බව,

ආදී සම්ප්‍රකාශ රාශියක් ඉදිරිපත් කොට ඇත.

ඉහත විරෝධතාවයන්ට පිළිතුරු දෙන ඉල්ලුම්කරුගේ නියෝජිත මහතා-

(අ) තමා වතුසේවා සංගමයේ නියෝජනය කරන බව. මෙයින් වගඋත්තරකරුගේ ප්‍රකාශය බිඳ වැටේ.

(ආ) මෙම ආරවුල කම්කරු කොමසාරිස් වෙත යොමු කරන අවධියේ ඉල්ලුම්කරු වගඋත්තරකරු යටතේ සේවකයෙකු කරන අවධියේ ඉල්ලුම්කරු වගඋත්තරකරු යටතේ සේවකයෙකු ව සිටි බව,

(ඇ) වගඋත්තරකරුගේ දක්වන ලද හේතු සියල්ල ප්‍රතික්ෂේප කරන බව ඉල්ලුම්කරු වෙනුවෙන් දක්වා සිටී. ඔහුගේ ලිපිය 2015.09.30 දින ඉදිරිපත් කොට ඇත.

මෙම ආරවුල බේරුම්කරණට ''විභාග කළ නොහැකි කරුණක්'' යන්නෙන් වගඋත්තරකරුගේ නීතීඥ මහතාගේ මතය බැහැර කරමි. හේතුව එවකට අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍ය විජයදාස රාජපක්ෂ ගරු අමාත්‍යවරයාගේ 2015.03.12 දින යොමු කිරීම මගින් බලාත්මක වූ හෙයින් විභාග කළ හැකි කරුණක් සේ දැක්විය හැකිය. තවදුරටත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මඟින්ද ඒ සඳහා බලය ලැබී තිබීමෙන් විභාග කළ හැකි කරුණක් ලෙස සැලකිය හැකිය.

තවද ඉල්ලුම්කරු වගඋත්තරකාර ආයතනය යටතේ ක්ෂේත්‍ර නිලධාරියෙකු ලෙස සේවය කළ බව ''ඒ 01'' දරන ලේඛනය පැහැදිලි කරවන අතර ඔහුගේ සේවය කිරීම එනයින්ම අවබෝධ වේ. තවද ''ඉල්ලුම්කරු වගඋත්තරකාර සමාගම යටතේ රැකඩහේන වත්තේ සේවය කරන අවධියේ'' යන්නෙන් ආරවුලට හේතු වූ කරුණු සම්බන්ධයෙන් කාල වකවානුව පැහැදිලි වේ.

කාර්ය සටහන් පිටුව 0122 මෙසේ දැක්වේ.

ප්‍රඃ එවකට මොටකන්ද වත්තේ වැඩ කළා කියා කම්කරු කොමසාරිස්තුමන් පැමිණිල්ලේ සඳහන් කර තිබුණේ ඇයි?

උඃ මෙම පැමිණිල්ල යොමු කරන විට මා සේවයේ යෙදී සිටියේ මොටකන්ද වතුයායේ කියා වේ.

ප්‍රඃ R01 ''ඒ'' හි දැනට මොටකන්ද වතුයායේ ක්ෂේත්‍ර නිලධාරියෙකු ලෙස සේවය කරන යන්නෙන් සඳහන් කරන්නේ කුමක්ද

උඃ එවකට සේවයේ යෙදී සිටිය කාලයේදී වේ. ''දැනට මොටකන්ද වතු යායේ සේවයේ යෙදී සිටින කාලය වේ.

මෙම ප්‍රශ්න හා පිළිතුරු මඟින් යොමුවේ සඳහන් දැනට මොටකන්ද වතුයායේ සේවය කරන යන්නට පිළිතුරක් ලෙස සැලකිය හැකිය.

කාර්යය සටහන් 0123 පිටුව පරිදි හරස් ප්‍රශ්නවලට පිළිතුරු සපයන වගඋත්තරකරුගේ නීතීඥ මහතා මෙසේ සඳහන් කොට ඇත.

''හරස් ප්‍රශ්නවලදී පැන නොනැගුණු කරුණු විමසා සිටින හෙයින් ප්‍රශ්න ඇසීම පිළිබඳව විරුද්ධ වෙනවා තවද R01 කොමසාරිස්ගේ

ලිපියකි. එය අර්ථ කථනය කිරීම හෝ විස්තර කිරීමේ අයිතිය පාර්ශවකරුවන්ට නොමැති බව කියා සිටී.'' යන්න දෙපාර්ශවයටම අදාළ විය යුතුය. තමන්ගේ විරෝධතාවය ඔප්පු කිරීම සඳහා තමා R01 නමැති යොමුව විස්තර කථනය හා විරෝධතා දැක්වීම සඳහා ප්‍රයෝජනයට ගෙන ඇත. මේ අවස්ථාවේ ඉල්ලුම්කරු එම ප්‍රයෝජනය ගන්නා විට ඊට විරුද්ධ වේ. එසේ නම් එය දෙපාර්ශවයටම වලංගු විය යුතුය. වගඋත්තරකරුගේ නීතීඥ මහතා ප්‍රථමයෙන් තමාගේ වාසියට යොමුව විවේචනයට ගෙන ඉල්ලුම්කරුද තමාගේ වාසියට එම යොමුව සම්බන්ධව කථා කරන විට විරුද්ධත්වය පළ කරයි.

මෙම විරෝධතාවය පිළිගන්නේ නම් වගඋත්තරකරුගේ නීතීඥ මහතාටද වලංගු විය යුතුය. එහෙත් මෙහිදී ඉල්ලුම්කරු ගන්නා ස්ථාවරය පිළි ගැනීමට සිදුව ඇත. එබැවින් යොමුව අර්ථකථනය සඳහා දෙපාර්ශවයටම ඉඩ ලබා දී එහි අන්තර්ගතය පිළිගැනීමට ඉඩ හැරීම යුක්ති සහගත සේ සලකමි.

ඉල්ලුම්කරු වෙත වගඋත්තරකාර පාර්ශවය පදිංචියට ලබා දී තිබූ නිල නිවසේ විදුලි බිල වතු අධිකාරියේ නමින් පැවතීම මත එකී නිවසේ පදිංචිකරු වූයේ ඉල්ලුම්කරුද වතු අධිකාරියද යන පැනය ගැන විමසීමේදී එය ඉල්ලුම්කරුගේ පදිංචිය සඳහා වෙන් කොට තිබූ බව ස්ඵුඨ වේ.

ඉල්ලුම්කරු නිල නිවාසයෙන් ඉවත් කිරීම සම්බන්ධව පොලිසියට කරන ලද පැමිණිල්ල සම්බන්ධයෙන් කිසිදු සහනයක් නොලැබුණු බව තවදුරටත් කීය.

ඉල්ලුම්කරු වෙනුවෙන් සිය වෘත්තීය සමිතිය වන ලංකා වතු සේවා සංගමයේ ප්‍රධාන සභාපති ලෙස ධම්මික කුමාරසිරි ජයවර්ධන නමැති අය සාක්ෂියට ඉදිරිපත් විය.

මෙම සාක්ෂියේ සාක්ෂිය මගින් වගඋත්තරකාර ආයතනයේ නීතීඥ මහතාගේ තර්කයක් ද බිඳ වැටේ. එනම් ඉල්ලුම්කාර ආදිහෙට්ටි මහතා වෘත්තීය සමිතියේ සාමාජිකයෙක් ලෙස පිළි නොගන්නා බවය. ඔහු තවදුරටත් සිය වෘත්තීය සමිතියේ සමාජිකයෙක් බව පිළි ගැනීමට සිදු වේ.

එකී සාක්ෂිකරුට අනුව ආදිහෙට්ටි නමැති මෙම බේරුම්කරණයේ ඉල්ලුම්කාර මහතා 2011.02.04 දින බලහත්කාරයෙන් පදිංචිව සිටි වතුයාය සතු නිල නිවසින් නෙරපා හැරිය බව,

ඉල්ලුම්කරු ශාඛා ඒකකයේ සභාපති බවත්, වෘත්තීය සමිතියේ යම් යම් අවශ්‍යතාවන් සඳහා ඔහු පදිංචිව සිටි නිල නිවසට ගොස් ඇති බවත් පිළිගන්නා ලදී. ඉන් වගඋත්තරකාර පාර්ශවයේ නීතීඥ මහතා මෙම ඉල්ලුම්කරු කිසිදු වෘත්තීය සමිතියක සාමාජිකයෙක් නොවන බැවින් යොමුවේ සඳහන් කරුණු කෙරෙහි ඉල්ලුම්කරු සම්බන්ධ නොවන බවත් යනුවෙන් කරන ලද කරුණු අසත්‍ය බව හෙළි වේ.

වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් සහකාර කළමනාකාර ධූෂර මහතා සාක්ෂි ලබා දෙමින්

(අ) තමා වතු අධිකාරී ලෙස සේවය කරන බවත්, ඉල්ලුම්කරුට පදිංචිය සඳහා මුරකරුවන් සඳහා වෙන් කළ නිවාස දෙකෙන් එකක් දී තිබූ බවත්,

(ආ) අපිරිසිදුව තිබූ නිවසකට කොන්ඩ් පට්ටම් දැමූ බවත්,

(ඇ) නිවාසයෙන් ඉවත් කිරීම සම්බන්ධව පොලීසියට පැමිණිලි කළත් කිසියම් පියවරක් නොගත් බවත්,

(ඈ) ඉල්ලුම්කරු රැකඩහේන වත්තේ සිට මොටකන්ද වතුයාය වෙත මාරු කළ බවත්, කියා සිටියේය.

අනතුරුව ඉල්ලුම්කරු වෙනුවෙන් එක් හරස් ප්‍රශ්නයක් පමණක් අසා සාක්ෂිකරුට යාමට ඉඩ ලබා දුනි.

දෙපාර්ශවයේ ලිඛිත දේශන සඳහා දිනයක් ලබා දුන්නද, වගඋත්තරකාර පාර්ශවයේ නීතීඥ මහතා හට ලබා දුන් 2017.08.28 දින ඒ සඳහා 2017.09.18 දක්වා දින ලබා ගත් නමුත් මෙතෙක් ලිඛිත දේශන ඉදිරිපත් කිරීමට අපොහොසත්ව පවතී. නමුත් ඉල්ලුම්කාර පාර්ශවය වෙනුවෙන් ලිඛිත දේශන 2017.08.28 දින ඉදිරිපත් කොට ඇත.

ලිඛිත දේශන මත වැදගත්යයි සැලකිය හැකි කරුණු මෙසේය.

I. 1993.03.01 සිට පදිංචිය සඳහා නිල නිවසක් ලබා දීම.

II. තම තමන්ගේ නිවාසවල සිට වතුයායේ සේවය සඳහා පැමිණි අනිකුත් සේවකයන් හට නිවාස කුලියක් වගඋත්තරකරු විසින් ගෙවූ බව,

III. මොටකන්ද වතුයාය වෙත තම නිවසේ සිට ගමන් කිරීමට පිරිවැය රු.325 හෝ 375ක මුදලක් වැය වන බව,

IV. සභාපති ඇතුළු මැර කණ්ඩායමක් ඉල්ලුම්කරුගේ නිල නිවසට බලහත්කාරයෙන් පැමිණ බටු මුට්ටු එළියට ඇද දමා කටයුතු කිරීම,

ආදියයි.

*ප්‍රදානය කෙරෙහි බලපාන ලද සුවිශේෂී කරුණු:*

(අ) ඉල්ලුම්කරුගේ සාක්ෂිය.

(ආ) හරස් ප්‍රශ්නවලට මුහුණ දුන් ආකාරය හා දෙන ලද උත්තර

(ඇ) වගඋත්තරකාර පාර්ශවයේ නීතීඥ මහතාගේ මූලික විරෝධතා.

(ඈ) යොමුවෙහි පවතින්නේ යයි කියන ලද කරුණු හා ඒ කෙරේ මා සොයා ගත් පිළිතුරු,

(ඉ) ඉල්ලුම්කරු වතු නිවසින් බලෙන් ඉවත් කළේ යැයි යන්න වතු අධිකාරියේ සාක්ෂිය මත ද සනාථ වීම,

(ඊ) ''රැකඩහේන වත්තේ සේවය කරන අවධියේ ඔහු වෙත ලබා දුන් නිල නිවස කිසිදු විකල්ප දීමනාවක් නොගෙවා ආපසු ලබා ගැනීම'' යන්න තුළ නිවසක් ලබා දී තිබූ බව පිළිගෙන තිබීම.

(උ) ''කිසිදු විකල්ප දීමනාවක් නොගෙවා ආපසු ලබා ගැනීම'' යන්නෙන් ඉල්ලුම්කරුට සිදුව ඇති අගතිය මැනවින් හෙළි වීම.

(ඌ) පොලිස් පැමිණිල්ල සම්බන්ධව පොලීසිය ක්‍රියා කොට ඇති ආකාරය සාමාන්‍ය පුරවැසියෙකු කෙරේ පොලිසියේ ක්‍රියා කලාපය මේ යයි පිළිගත හැකි වීම, ආදියයි.

මෙහි කරුණු සහ ඉල්ලුම්කරුගේ සාක්ෂිය, හරස් ප්‍රශ්න කෙරේ මුහුණ දුන් ආකාරය, දෙන ලද පිළිතුරු ආදිය සැලකිල්ලට ගෙන මෙම ප්‍රදානය කරමි.

එනම් රැකඩහේන ප්ලාන්ටේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් යටතේ දැනට මොටකන්ද වතුයායේ ක්ෂේත්‍ර නිලධාරියෙකු ලෙස සේවය කරන අනුර වසන්ත ආදිහෙට්ටි මහතා එම සමාගම යටතේ රැකඩහේන වත්තේ සේවය කරන අවධියේ ඔහු වෙත ලබා දුන් නිල නිවස කිසිදු විකල්ප දීමනාවක් නොගෙවා ආපසු ලබා ගැනීම යුක්ති සහගතද යන්නට පිළිතුර ''නැත'' යනුවෙන් නිගමනය කරන අතර එසේ නොවන්නේ නම් ඔහු වෙත ලබා දිය යුතු සහන කවරේද යන්නට පිළිතුර ''නැත'' යනුවෙන් නිගමනය කරන අතර එසේ නොවන්නේ නම් ඔහු වෙත ලබා දිය යුතු සහන කවරේද යන්නට පිළිතුරු නම් ඔහු නිල නිවසින් හදිසියේ පිටමං කිරීම හා ඔහුගේ ගෘහ භාණ්ඩ හානිවීම සැලකිල්ලට ගෙන ඔහුට සිදුව ඇති මානසික ඉංජුරියාව වෙනුවෙන් රුපියල් දෙලක්ෂයක (200,000) මුදලක් එකවර වගඋත්තරකාර රැකඩහේන ප්ලාන්ටේෂන් ප්‍රයිවෙට් ලිමිටඩ් යන සමාගම විසින් ගෙවිය යුතු බවට නිගමනය කොට ප්‍රදානය ලබා දෙමි. එම මුදල නැගෙනහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත් කළ යුතු බවද එය මෙම ප්‍රදානය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළවූ දින සිට මසක් ඇතුළත ගෙවීම් කටයුතු සිදු කිරීමට වග බලාගන්නා මෙන් වගඋත්තරකාර පාර්ශවයට නියෝග කරමි.

මෙම ප්‍රදානය සම්බන්ධ නඩු විභාගය සම්බන්ධයෙන් ඉහත සඳහන් ගෙවීම හැර ගමන් වියදම් හෝ අමතර වියදම් සඳහා කිසිදු ගෙවීමක් අදාළ නොවන බවද සඳහන් කරමි.

මෙම ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත යයිද තීරණය කරමි.

මෙයට
බේරුම්කරු

2018.07.19

09 - 403